| පාඨමාලාව | PALI 3101.03 – පාලි ව්‍යාකරණ සම්ප්‍රදාය |
|---|---|
| දේශක | මැදගම්පිටියේ විජිතධම්ම හිමි |
| දේශනය | අංක 02 |
| මාතෘකාව | **ඉන්දු ආර්ය ව්‍යාකරණයේ අනතුරු අවස්ථා** |
| අරමුණ | ඉන්දු ආර්ය භාෂාවක් වන වෛදික/සංස්කෘතය තුළ ව්‍යාකරණය බිහි වූ ආකාරය පරීක්ෂා කිරීම |
| **අපේක්ෂිත ඉගෙනුම් ඵලය** | මෙම දේශනය අවසානයේ දී වෛදික හා සංස්කෘත භාෂා ආශ්‍රයෙන් ක්‍රමානුකූලව ව්‍යාකරණය බිහි වූ ආකාරය විස්තර කිරීමේ හැකියාව ඔබට ලැබෙනු ඇත. |

## ඉන්දු ආර්ය ව්‍යාකරණයේ අනතුරු අවස්ථා

**ශබ්දවිභාගය= ප්‍රාතිශාඛ්‍ය**

ශබ්ද විභාගය පිළිබඳ නීති රීති ඉන්දු ආර්ය ව්‍යාකරණයේ දෙවන පියවර ලෙස සැලකිය හැකිය. ඒවා සකස් වූයේ වාක්‍ය විග්‍රහ අංශය තරමක් දියුණු වූ පසුව ය. මේ ශබ්ද විචාරාත්මක වාග්රීති ප්‍රාතිශාඛ්‍ය නමින් හැඳින්වෙන කෘතිවල ඇතුළත් වේ.[1] ප්‍රාතිශාඛයන්ගේ ප්‍රභවය පිළිබඳ කරුණු දක්වන මැක්ස්මුලර් මහතා බ්‍රාහ්මණ යුගය වන විටත් පරම්පරාගතව පවත්වාගෙන එනු ලැබූ මන්ත්‍ර භාෂාව වෙනස් නොකළ යුතුව පැවති අතර ව්‍යවහාර භාෂාව වෙනස්වෙමින් ඉදිරියට ගමන්ගත් බවත් ශුද්ධ මන්ත්‍රයන්ගේ ඡන්දස් හා උච්චාරණය, ස්වරණය ආදිය ඒ සම්බන්ධයෙන් දැඩි නියමයන් නොපනවා ආරක්ෂා කර ගැනීම දුෂ්කර වූ බවත් පෙන්වා දී එම පදනම මත ප්‍රාතිශාඛ්‍ය කෘති පහළ වූ බව ප්‍රකාශ කරයි. ප්‍රාතිශාඛ්‍යවල ඇත්තේ උච්චාරණය ස්වරණය ආදිය හා යම් යම් අක්ෂරයක් නොහොත් පදයක් ශබ්ද කිරීමේ නියම ක්‍රමයත් ය.

වේදයේ ශාඛාවක් පාසා අති වූ ග්‍රන්ථ ප්‍රාතිශාඛ්‍ය නමින් හඳුන්වා ඇති අතර ඉතා පැරණි ඍග්වේද ප්‍රාතිශාඛ්‍යය රචනා කරන ලද්දේ ශෞනකයන් විසිනි. තෛත්තිරීය ප්‍රාතිශාඛ්‍ය කෘෂ්ණ යජූර් වේදයට අයත්ය. කාත්‍යායන විසින් රචිත වාජසනේයි ප්‍රාතිශාඛ්‍යය ශුක්ල යජූර් වේදයේ ප්‍රාතිශාඛ්‍යය ශෞනකගේ නිර්මාණයකි. මෙයින් වඩා පැරණි වන්නේ ඍග්වේද ප්‍රාතිශාඛ්‍යය යි. දැනට ශේෂ ව ඇති ඍග්වේද ප්‍රාතිශාඛ්‍යය වාග්විද්‍යා විෂයයක් සම්බන්ධයෙන් රචිත විද්‍යමාන ආදි ම කෘතිය වන යාස්කගේ නිරුක්තයට වඩා පසු කාලයට අයත් වුව ද යාස්කට පෙර ප්‍රාතිශාඛ්‍ය විශේෂයක් තිබූ බවට සාධක ඔහුගේ කෘතියෙහි ඇතුළත් ය. චතුර්විධ පද විශේෂ, නාමාඛ්‍යාතයන්ගේ ලක්ෂණ ආදි විවිධ ව්‍යාකරණ කරුණු පිළිබඳ ව උක්ත ප්‍රාතිශාඛ්‍ය සම්ප්‍රදාය ඔස්සේ වැඩී ආ අදහස් නිරුක්තයේ ද දක්නට ඇත.

ව්‍යාකරණමය අංශයෙන් සලකන කල්හි සංස්කෘත වර්ණමාලාව වර්ගකිරීමත් ගණවලට බෙදීමත් ප්‍රාතිශාඛ්‍යවල දී සිදුවී ඇත.

අෂ්ටෞ සමානාක්ෂරාණ්‍යාදි - තතස්තතශ්චත්වාරි සන්ධ්‍යක්ෂරාණ්‍යුත්තරානි
එතෙ ස්වරා ඉතරෝ දීර්ඝවත් ප්ලුතො'නුස්වාරෝ ව්‍යඤ්ජනං වා ස්වරෝ වා

1 පටලය 1 ශ්ලෝකය[2]

සමානාක්ෂර අටක් බවත් ඒවායේ අවසන් සතර සන්ධ්‍යක්ෂර බවත් මෙහි පැහැදිලිව ම පෙන්වා දී තිබේ. එමෙන් ම අනුස්වාරය ස්වරයක් හෝ ව්‍යඤ්ජනයක් සේ සැලකිය හැකිය යන අදහස ද මෙයින් ඉදිරිපත් වේ. පසුව ඉන්දු ආර්ය ව්‍යාකරණවල භාවිතයට පැමිණි ස්වර, ව්‍යඤ්ජන, දීර්ඝ, ප්ලුත, සමානාක්ෂර, සන්ධ්‍යක්ෂර, අනුස්වාර ආදි ව්‍යාකරණ පාරිභාෂික ශබ්ද මුල්වරට ප්‍රාතිශාඛ්‍යවල ඇති බවට ද මෙය සාධකයකි. තව ද ඉන්දු ආර්ය භාෂාවල වර්ණමාලාවන්හි දක්නට ඇත්තේ ද ප්‍රාතිශාඛ්‍යවල දක්වා ඇති ශබ්ද පිළිබඳ මෙම වර්ග කිරීම් ය.

එපමණක් නොව නාම ආඛ්‍යාත උපසර්ග නිපාත යන චතුර්විධ පද භේදයක් ප්‍රාතිශාඛ්‍යවල දක්නට ඇත. සිව්වැදෑරුම් පද ඍග්වේද ප්‍රාතිශාඛ්‍යයේ දක්වා ඇත්තේ ''නාමාඛ්‍යාතමුපසර්ගෝ

---

[1] චිත්‍රා ජයසේකර සහ තවත් අය, 1996, පි. 89
[2] සිළුමිණ ශාස්ත්‍රීය අතිරේකය, 1947-11-16 කලාපය

නිපාතශ්ච චෝර්තයාහුඃ පදජාතානි ශබ්දාඃ'' යනුවෙනි. කාත්‍යායනගේ ශුක්ල යජුර්වේද ප්‍රාතිශාඛ්‍යයේ අවසාන අධ්‍යායෙහි ද ''තච්ච චතුර්ධා නාමාඛ්‍යාතෝපසර්ගනිපාතාඃ'' යනුවෙන් මෙම බෙදීම ම දක්වේ.[15] එහි වැඩිදුරටත් දක්වෙන විස්තර අනුව පැහැදිලි වන්නේ මේ එක් එක් පදයන්ගේ කාර්යය ද අවධාරණය වී ඇති බව යි. ඒ අනුව සත්ත්වාභිධායකත්වය (සත්ත්ව-පුද්ගලාදීන්ගේ නම් දක්වීම), ක්‍රියාවාචකත්වය (කරන දෙය හැඟවීම), විශේෂකරණය (ක්‍රියාවේ විශේෂතා දක්වීම) හා පාදපූරණය (පදපිරවීම) පිළිවෙළින් චතුර්විධ පදයන්ගේ කාර්යය වෙයි.[3]

මේ නිසා ප්‍රාතිශාඛ්‍ය ඉන්දු ආර්ය ව්‍යාකරණයේ පුරාණතම නිර්මාණ වශයෙන් සලකනු යුක්ති යුක්ත ය.

**දුරවබෝධ පද සංග්‍රහ= නිඝණ්ටු**

පශ්චාත් වෛදික යුගයේ දී සකස් වී යැයි සැලකෙන නිඝණ්ටු ද ව්‍යාකරණයේ ආරම්භය සම්බන්ධයෙන් වැදගත් වේ. ඒවා පහළ වූයේ වේද සංහිතාවන්ගේ පදගතාර්ථ විස්තර කිරීමේ දී ඇති වූ දුෂ්කරතාවයන් මගහරවා ගැනීමට කරන ලද උත්සාහයක ප්‍රතිඵලයක් වශයෙනි. නිඝණ්ටු යන්න විස්තර කර ඇත්තේ ''සමාම්නායඃ සමාම්නාතඃ ස ව්‍යාඛ්‍යාතව්‍යඃ තම්මං සමාම්නායං නිඝණ්ටව ඉත්‍යාචක්ෂතේ'' යනුවෙනි. ව්‍යාඛ්‍යාන කළ යුතු පද සංග්‍රහය සමාම්නාය නම්වන අතර එම සමාම්නාය නිඝණ්ටු නම් වන බව එයින් ප්‍රකාශ වේ. නිඝණ්ටු නම් කවරේදැයි විස්තර කරන යාස්ක වේදයෙන් උපුටාගෙන එක්රැස් කරන ලද වෛදික පද සංග්‍රහයක් එයින් අදහස් වන බව පවසයි. නිශ්චය වශයෙන් තීරණය කරන ලද අර්ථ ඇත්තාහු මන්ත්‍රාර්ථයන් හඟවත්නුයි මේ නිඝණ්ටු පද නිගම පද නම් වන බව දුර්ගාචාර්යයන් විසින් නානාර්ථ ධ්වනිමඤ්ජරියේ දී දක්වා තිබේ. පූර්වයෙහි වූ වේදකර්තෘක ඍෂීහු පසක් කළ ධර්ම ඇත්තෝ වූහ. ඔවුහු වේද මන්ත්‍ර පසක් නොකළ පශ්චාත්කාලීනයන්ට මුඛ පරම්පරාවෙන් එය ඉගැන්වූහ. පසුකාලීන පරම්පරාවෝ පසක් කළ ධර්ම ඇත්තෝ නොවන්නාහු මුඛ පරම්පරාවෙන් ඉගෙනීමෙන් වෙහෙසට පත්වූවාහු වේදාධ්‍යයනය පහසු කරනු සඳහා නිඝණ්ටු සම්පාදනය කළහ. හේමචන්ද්‍රගේ කෝෂයට අනුව නිඝණ්ටු යනු නාම සංග්‍රහයකි. භාෂ්‍යකාර සායණයන් විසින් ''ඒකාර්ථවාචීනාං පර්යාය ශබ්දානං සංඝෝ යත්‍ර ප්‍රායෝණෝපදිශ්‍යතේ තත්‍ර නිඝණ්ටු ශබ්දඃ ප්‍රසිද්ධඃ'' යනුවෙන් දක්වා ඇත්තේ ඒකාර්ථවාචී ශබ්ද සමූහයන්ගේ එකතුව නිඝණ්ටු නම් වන බව යි.[4]

නිඝණ්ටුවල කර්තෘත්වය වේද මන්ත්‍ර පසක් කළ පුරාතන ඍෂීන්ට පසුව ආ පශ්චාත් පරම්පරාවන්ට පවරනු ලැබේ. නිඝණ්ටුවේ දක්නට ලැබෙන පරස්පර විරෝධී ලක්ෂණ නිසා මෙය බහු කර්තෘක කෘතියක් ලෙස ද හඳුන්වනු ලැබේ. එහෙත් මහාභාරතයේ මෝක්ෂ පර්වයේ එන

''වෘෂෝහි භගවාන් ධර්මඛ්‍යාතෝ ලෝකේෂු භාරත
නිඝණ්ටුක පදඛ්‍යානේ විද්ධි මාං වෘෂමුත්තමං''
''කපිර්වරාහ ශ්‍රේෂ්ඨශ්ච ධර්මශ්ච වෘෂ උච්‍යතේ
තස්මාත් වෘෂාකපිං ප්‍රාහ කාශ්‍යපෝ මාං ප්‍රජාපතී''[5]

යන පද්‍යද්වයට අනුව නිඝණ්ටුව ප්‍රජාපතී කාශ්‍යපයන්ගේ කෘතියක් ලෙස සැලකේ. මේ වෘෂකපි යන නාමය නිඝණ්ටුවේ සඳහන් වීම සලකා එහි කර්තෘ ලෙස ඔහුව ගැනීම ප්‍රතිෂ්ඨා විරහිත දුබල තර්කයක් ලෙස ලක්ෂ්මන් සරුප් මහතා සඳහන් කරයි.[6]

නිඝණ්ටුව අධ්‍යාය පහකට බෙදෙයි. එහි පද 1765 ක් ඇතුළත් වෙයි. උක්ත අධ්‍යාය පහ නැවත කොටස් තුනකට බෙදෙයි.[7]

1. නෛඝණ්ටුක කාණ්ඩය 1-2-3 අධ්‍යාය

---

[3] ක්‍රියාවාචකමාඛ්‍යාතොමුපසර්ගො විශේෂකෘත්
සත්ත්වාභිධායකං නාම නිපාතඃ පාද පූරණඃ ජිනසෝම වීරසූරිය, පි. 17

[4] එම, පිටු 20-24

[5] එම, පි. 28

[6] Lakshman Sarup, The Nighantu and the Nirukta, English Translation and Introduction with Notes, Mothilal Benarsidas, India, 1962, p. 14

[7] International Encyclopaedia of Indian Literature, VII-I part I, G.P. Offset Printers, Delhi, p. 571

2. නෛගම කාණ්ඩ 4. අධ්‍යාය
3. දෛවත කාණ්ඩය 5. අධ්‍යාය

මෙයින් නෛඝණ්ටුක කාණ්ඩයේ සමානාර්ථ පද ද නෛගම කාණ්ඩයේ නානාර්ථ පද ද දෛවත කාණ්ඩයේ දේවතාඛ්‍යාන වාද විෂයක හා යඥා විෂයක පද ද සංග්‍රහ වී තිබේ. ඒ තුළ නාමපද, අව්‍යපද හා ක්‍රියාපද සංග්‍රහ වී ඇත. නිඝණ්ටු පද නාම, ආඛ්‍යාත, උපසර්ග, නිපාත යනුවෙන් සිවු වැදෑරුම් බව යාස්ක සඳහන් කර ඇතත් උපසර්ග පද නිඝණ්ටුවේ සංග්‍රහ වී නැත.

**අර්ථ විවරණ= නිරුක්ත**

ඉහත දී සඳහන් කළ නිඝණ්ටුවල ඇතුළත් ගැඹුරු වචන විග්‍රහ කර අර්ථ පැහැදිලි කිරීමට දැරූ ප්‍රයත්නයක ප්‍රතිඵලයක් වශයෙන් භාරතීය වේදාධ්‍යයන සම්ප්‍රදාය තුළ නවතම අධ්‍යයන අංශයක් බිහිවිය. එය නිරුක්ත නමින් හැඳින්වෙයි.[19] නිරුක්තය වේදයේ අර්ථාවබෝධය සඳහා අවශ්‍යයෙන් ම දත යුත්තක් වශයෙන් එහි කර්තෘ සේ සැලකෙන යාස්ක හඳුන්වා දී තිබේ.[8] යාස්කට පෙර පටන්ම නිරුක්ත ක්‍රමය පැවති බව බ්‍රාහ්මණ සාහිත්‍යය අනුව පැහැදිලි වේ. යාස්කගේ කාලය වන විට නිරුක්ති ක්‍රමය සම්මත ශාස්ත්‍ර විෂයක් ලෙස සකස් වී තිබූ බව නෛරුක්තිකයන්ගේ මත ප්‍රමාණාත්මක වශයෙන් යාස්ක දක්වා තිබීමෙන් පැහැදිලි වේ. යාස්කට පෙර විසූ නිරුක්ති රචකයෙකු ලෙස ශාකපූර්ණගේ නාමය විෂ්ණු පුරාණයේ දැක්වේ.[9]

මෙහි සඳහන් ශාකපූර්ණ ව්‍යාසගේ ශිෂ්‍යයෙකි. මොහු හැර තවත් නිරුක්තකරුවන් යාස්කට පෙර සිටි බව කියවෙන නිසා නිරුක්තය කාලයක් මුළුල්ලේ වර්ධනය වෙමින් පැවත ආ බව සිතිය හැකිය. එමෙන්ම එහි අග්‍රපුෂ්පය විකසිත වූයේ යාස්කගේ නිරුක්තිය තුළිනි.

නිරුක්ති ශාස්ත්‍රය ආදියේ සිටම ව්‍යාකරණය හා බැඳී පැවති බවට සාක්ෂි ද නිරුක්තයෙන් ලැබේ. අර්ථය නොවැටහෙන්නහුට ස්වරය හා ව්‍යාකරණයෝගය මැනවින් පිරික්සීමට නුපුළුවන් බව ද එහෙයින් නිරුක්ති ශාස්ත්‍රය ව්‍යාකරණයේ පරිපූරිකාංගය බව ද යාස්ක පවසා ඇත.

''අර්ථමප්‍රතීයතෝ නාත්‍යන්තං ස්වර සංස්කාරෝද්දේශඃ
තදිදං විද්‍යාස්ථානං ව්‍යාකරණස්‍ය කාර්ත්ස්න්‍යම්ඃ යනුවෙනි.[10]

මෙයින් පෙනෙන්නේ නිරුක්තය ව්‍යාකරණයේ ඉතා වැදගත් ස්ථානයක් නියෝජනය කරන බවයි. පෙර අපර දෙදිගම උගතුන්ගේ සම්භාවනාවට පාත්‍ර වූ යාස්ක නිරුක්තය අධ්‍යාය දොළසකින් සමන්විත වේ.

1 අධ්‍යාය - ව්‍යාකරණය හා අර්ථ ව්‍යාඛ්‍යානය පිළිබඳ හැඳින්වීම
2-3 අධ්‍යාය - 2 අධ්‍යාය (ආරම්භය) නිරුක්ති ශාස්ත්‍රයේ ප්‍රයෝජනය
2 අධ්‍යාය මධ්‍යයේ සිට පර්යාය නිඝණ්ටු පදවල අර්ථ දැක්වීම
4-6 අධ්‍යාය - නිඝණ්ටුවේ 4 අධ්‍යායට නිරුක්ති දැක්වීම
7-12 අධ්‍යාය - නිඝණ්ටුවේ 5 අධ්‍යායට නිරුක්ති දැක්වීම

යාස්ක නිඝණ්ටුවේ සියළු අධ්‍යාය ආවරණය කළ ද නිරුක්ති සපයා ඇත්තේ නිඝණ්ටු පද 350 කට පමණි. නිඝණ්ටුවේ නැති 1298 ක් පමණ වූ වචන ප්‍රමාණයකට ද යාස්ක නිරුක්ති සපයා ඇති බව සිද්ධේශ්වර වර්මා ගණනය කර තිබේ.[11] නිඝණ්ටු පද නිරුක්ති මාර්ගයෙන් ව්‍යාඛ්‍යානය කිරීමෙන් යාස්ක අදහස් කළේ වේදමන්ත්‍රයන්ගේ අර්ථාවබෝධය පහසු කිරීම යි. නිරුක්ති ශාස්ත්‍රය නැතිව මන්ත්‍රයන්ගේ අර්ථය වටහාගත නොහැකි බවත් සෑම පදයක් ම සීමා සහිත ධාතු සංඛ්‍යාවකින් බිඳී පැමිණ ඇති බව

---

[8] නිරුක්ත 1.15 අථාපීදමන්තරෙණ මන්ත්‍රේෂ්වර්ථප්‍රත්‍යයො න විද්‍යතෙ
[9] ''සංහිතාත්‍රිතයං චක්‍රේ ශාකපූර්ණස්තථේතරඃ
නිරුක්තිමකරෝත් තද්වච්චතුර්ථං මුනිසත්තම
ක්‍රෞඤ්චෝ වෛතාලිකස්තද්වද් බලාකශ්ච මහාමුනිඃ
නිරුක්තකෘච්චතුර්ථෝ'භූත් වේදවේදාංගපාරගඃ''
[10] ජිනසෝම වීරසූරිය, පි. 23
[11] Siddhesvar Varma, The Ethymologies of Yaska, Visvesvaranand Institute of Publications, 1953

යාස්ක පෙන්වා දී තිබේ. එය නිරුක්තයේ ව්‍යාකරණාත්මක වැදගත්කම තහවුරු කිරීමේ වැදගත් සාධකයකි.

ඒ හා සම්බන්ධ තවත් සාධක රැසක් ද වේ. 'නාම ආඛ්‍යාතජ ය' යන ඉපැරණි මතය ගරු කළ යාස්ක සෑම පදයක් ම ධාතුවකින් තැනී ඇති බව විශ්වාස කරයි. යම් පදයක ස්වරය හා ව්‍යාකරණය යෝගය යන දෙක ක්‍රමවත්ව එනම් නියම පිළිවෙළට ඇති ව, එසේ ම ධාතුව පිළිබඳව විකාරයක් ද ඇති විට නියම පිළිවෙළට එය තේරුම් කළ යුතුය. එසේ ම අර්ථය අනුගත නොවී ධාතු විකාරයක් ද නොමැති කල්හි අර්ථය පිහිට කොට කිසියම් රූප සාම්‍යයක් අනුව විමසිය යුතුය. එබඳු සාම්‍යයක් නොදක්නා කල්හි අක්ෂරයක හෝ වර්ණයක සාම්‍යය බලා තේරුම් කළ යුතුය.'' යනුවෙන් ඔහු ඉදිරිපත් කරන කරුණු ව්‍යාකරණය සම්බන්ධයෙන් ඉතා වැදගත් වේ. නිදසුන් ලෙස දා ධාතුවෙන් හින්න ප්‍රත්ත, අවත්ත ආදි රූපයන්හි ධාත්වාදි පමණක් ශේෂ වීම, අස් ධාතුව වරනැගීමේ දී නිවෘත්ති ස්ථානවල ස්තඃ, සන්ති ආදි වශයෙන් ධාතුවට ආදි ලෝපය වීම, ගත්වා ආදි රූපවල ගම් ධාතුවේ අන්තයත් ජග්මතුඃ ආදියෙහි උපධාවත් ලොප් වීම ආදි වශයෙන් භාෂාවේ යෙදෙන ව්‍යාකරණ නියමයන් රාශියක් ඔහු පෙන්වා දී තිබේ.

'අර්ථය සමාන නම් නිර්වචනය ද සමානය. අර්ථය වෙනස් නම් නිර්වචනය ද වෙනස් ය. අර්ථ අනුව පදයන්ගේ නිර්වචන දැක්විය යුතුය' යනුවෙන් නිරුක්ති කීමේ මූලධර්මයක් යාස්ක දක්වා තිබේ. වෙනස් මූලවලින් හටගත් නමුදු සමාන රූප ඇති එහෙත් වෙනස් අර්ථ ඇති ශබ්ද බොහොමයක් භාෂාවල දක්නා ලැබෙන හෙයින් යාස්කගේ මේ නියමය අර්ථකථනයේ දී බොහෝ දුරට ආධාර වෙයි. ප්‍රකරණය කවරක් වුවත් එකම අර්ථයක් යම් පදයකින් ලැබෙන විට ඒ සෑම තැනක ම එහි නිරුක්තිය එක ය. එක ම රූපයක් ඇති පදයක් වෙනස් වෙනස් තන්හි වෙනස් අර්ථ දෙන විට ඒ වෙනස් අර්ථ ලැබෙන පරිදි වෙනස් ලෙස නිර්වචන කිව යුතු බව මෙයින් ප්‍රකාශ වේ. ගෞඃ යන පදයෙහි නිරුක්තිය එවැන්නකි. ගෞඃ යනු පෘථිවි නාමයකැයි දක්වන යාස්ක ඈතට ගියේය යන අර්ථයෙන් එය ගම් ධාතුව සමග ද නැතහොත් ඕ ප්‍රත්‍යය සහිත ගා ධාතුව සමග ද සම්බන්ධකොට දක්වයි. ඒ ධාත්වර්ථයෙන් ම එය පශු නාමයක් ද වේ. බොහෝ ඉහළට ගිය හෙයින් ආකාශය ද එනම් වේ. 'හී යවන්නේය' යන්නෙහි එම අර්ථයෙන් ම දුනුදිය ද එනම් වේ. එම ධාත්වර්ථයෙන් ම සූර්යයා ද ගෞඃ නම් වේ. පෘථිවියෙහි වූ රසයන් වාෂ්පාකාරයෙන් ඉහළ නංවන හෙයිනි. එසේ ම අන්තරීක්ෂයෙහි ගමන් කරන බැවිනි.

පද විග්‍රහය සඳහා ද නිරුක්ති ශාස්ත්‍රය අනිවාර්යයෙන් දතයුතු බව යාස්ක දක්වා ඇති අතර අංග එකකින් හෝ වැඩි ගණනකින් සමන්විත තද්ධිත සමාස ආදිය පළමුවෙන් විග්‍රහ කොට අනුපිළිවෙළින් ඒවායේ අර්ථ කිවයුතු බව ද දක්වා ඇත.

නිඝණ්ටුවල දී අතහැරී තිබූ උපසර්ග පද නිරුක්තයෙහි විමසීමට භාජනය වී තිබේ. සිව් වැදෑරුම් පද දක්වන මොහු ''තද් යානි චත්වාරි පදජාතානි නාමාඛ්‍යාතෙ චොපසර්ගනිපාතාශ්ච තානිමානි භවන්ති'' යනුවෙන් උපසර්ග ද ඊට ඇතුළත් කර ඇත. ආ, ප්‍ර, පරා, අභි, ප්‍රති, අති, සු, නිර්, දුර්, නි, අව, උත්, සං, වි, අප, අනු, අපි, උප, පරි, අධි යන උපසර්ග විස්ස පළමුවරට දක්වා ඇත්තේ නිරුක්තයේ දී ය. එපමණක් නොව එහි උපසර්ගයන්හි අර්ථ ද දක්වා ඇත. නිපාත පිළිබඳව විස්තර කරන නිරුක්තය ඒවා කොටස් තුනකට බෙදා තිබේ.

1. උපමාර්ථයෙහි නිපාත - ඉව න, චිද්, නු
2. කර්මෝපසංග්‍රහාර්ථයෙහි නිපාත - ච, ආ, වා, අහ, හ, උ, හි, කිල, මා, බලු ආදිය
3. පද පූරණ නිපාත - ඉම්, ඊම්, ඉද්, උ, ඉව,

ඉහත දැක්වූ කරුණු අනුව පෙනී යන්නේ නිරුක්තය ව්‍යාකරණාත්මක විග්‍රහවලින් කෙතරම් පොහොසත් ද යන්න යි.

මෙතෙක් කරන ලද සාකච්ඡාවෙන් පෙරදිග ව්‍යාකරණයේ ආරම්භයට පදනම් වී යැයි සලකිය හැකි භාෂා අධ්‍යයන අංග හතරක් අනාවරණය කරගත හැකි විය. එනම් ශික්ෂා, පදපාඨ, නිඝණ්ටු, නිරුක්ත යනුවෙනි.

**ව්‍යාකරණ ග්‍රන්ථ බිහිවීම= අෂ්ටාධ්‍යායී හෙවත් පාණිනීය ව්‍යාකරණය**

පිළිවෙළින් වැඩී ආ ව්‍යාකරණ විවරණ ක්‍රමය පරිපූර්ණත්වයට පත්ව ග්‍රන්ථයක් වශයෙන් සකස් වූයේ පාණිනි නැමැති මුනිවරයා අතිනි. එය ඉන්දු ආර්ය භාෂාවෙහි ප්‍රථම හා අග්‍රතම ව්‍යාකරණය යි.

පාණිනී පහළ වූයේ වෛදික භාෂාව විවිධ දුෂ්කරතාවයන්ට මුහුණපා විපර්යාස තත්ත්වයට පත්වෙමින් පැවති කාල පරිච්ඡේදයක දී ය. වේද භාෂාවේ ඓතිහාසික ක්‍රම විකාශය දෙස බැලීමේ දී ආර්යයන් ඉන්දියාවට සංක්‍රමණය වූ මුල් අවදියේ පටන්ම වෛදික වාක්කෝෂයේ සැලකිය යුතු වෙනස්කම් ඇතිවන්නට වූ බව පෙනේ. පැරණි වෛදික වචන බ්‍රාහ්මණ යුගය වන විට නැති වී දුරවබෝධත්වයට පත්ව තිබිණි. යාස්කාදීන් ඒවායේ අර්ථ දක්වන්නට බොහෝ උත්සාහ දැරූ බව පෙනෙතත් ඒවාද වඩා සාර්ථක වී නැති බව උගත්තු පවසති. වියරණ අතින් බලන විට ශබ්දප්‍රකෘති නිෂ්පාදනය අතින් මුලින් පැවති නානාත්වය හීනවීම නිසාත් පෙර බහුලව පාවිච්චි වූ ඇතැම් ප්‍රත්‍ය භාවිතයෙන් ඉවත්වීම නිසාත් ඇතැම් වචන වර්ග සම්පූර්ණයෙන් අප්‍රකට තත්ත්වයට පත්විය. කෘත් ප්‍රත්‍යයක් වශයෙන් මෙන් ම තද්ධිත රූප සාධනයෙහි ලා ද වේදයෙහි භාවිත වූ 'යු' ප්‍රත්‍යය පසු කාලයේ අභිවයට ගොස් මන්‍යු ආදි ප්‍රකට අර්ථ ඇති පද කිහිපයක් පමණක් ඉතිරිව තිබීම නිදසුන් සේ දැක්විය හැකිය. නාම වරනැගීම ද වඩා සරලත්වයක් හා සමරූපතාවයක් භජනය කරන්නට පටන් ගැනීමෙන් පෙර පැවති විවිධත්වය අඩුවිය. වේදයේ භාවිත වූ තුමන්ත රූප පූර්ව ක්‍රියා ප්‍රත්‍ය ගිලිහී යෑම, ලේට් ආදි ක්‍රියා රූප අභාවයට යෑම, සාර්වධාතුක හෙවත් ලට් වර්ගීය ධාත්වංග පමණක් ශේෂ කොට ලිට්, ලුඞ්, ලෘට් වර්ගීය ධාත්වංග භාවිතයෙන් ඉවත් වීම, උපසර්ගවලට වේදයේ තිබූ ස්වාදීනත්වය අහිමි වී එය ක්‍රියා රූපය සමග එක් කළ යුතු වීම යන මේ කරුණු භාෂාත්මකව සිදු වූ ප්‍රධාන වෙනස්කම් කිහිපයකට නිදසුන් ය. එසේ ම ප්‍රාග් ආර්ය දේශීය භාෂාවන්හි ලක්ෂණ පසුකාලයේ දී වෛදික භාෂාවට ඇතුල් විය. ඉන්දු ආර්ය භාෂාවේ ඇතැම් මූර්ධන්‍ය ශබ්ද හැඩගැසීම, නව වචන එකතුවීම ඊට නිදසුන් වේ.[12]

අස්තයට යොමුව තිබූ වේද භාෂාවත් සීඝ්‍ර ලෙස වර්ධනය වෙමින් පැවති ලෝක භාෂාත් අතරේ සන්ධිස්ථානයකට භාෂාව එළඹ තිබූ බැවින් ඒ දෙක අතර සම්බන්ධය රැකගැනීම සඳහා සේතුවක් තැනීම අවශ්‍යව තිබිණ. ඒ වන විට පොදු ජන ව්‍යවහාරයේ පැවති ජීවමාන ප්‍රාකෘත භාෂාවන්ගේ ග්‍රහණයෙන් යටපත් වීමට නොදී වේද භාෂාව රැක ගැනීමට ක්‍රියාමාර්ගයක් ද ගතයුතුව තිබිණි. මෙම කාර්යය කරට ගනුලැබුවේ පාණිනී මුනිවරයා ය.

පාණිනී මුනිවරයා භාරතයේ ගන්ධාර ජනපදයේ ශලාතුර ගමෙහි ඉපිද ක්‍රිෘපූ: 4 වැනි සියවසේ වාසය කළ අයෙකි. ඔහු භාරතයේ විසූ මහාශාබ්දිකයන් අටදෙනාගෙන් කෙනෙකි.[13]

ඉන්ද්‍ර, චන්ද්‍ර, කාශකෘත්ස්න, අපිශල, ශාකටායන, පාණිනී, අමර, ජෛනේන්ද්‍ර යන ශාබ්දිකයන් අතුරින් කාශකෘත්ස්න, අපිශල, ශාකටායන ආදීන් පාණිනීට පෙර කාලයට අයත් වේ. ඊට හේතුව පාණිනීගේ කෘතියේ මොවුන්ගේ නම් සඳහන් ව තිබීම යි. පාණිනී ශික්ෂාවේ දැක්වෙන ආකාරයට ඔහු දාක්ෂී නැමැත බැමිණියගේ පුතා ය.[14]

පාණිනීන්ට පූර්ව වූ වෛයාකරණයන් හැට හතරක් පමණ සඳහන් වන හෙයින් ව්‍යාකරණය සම්බන්ධයෙන් ඔවුන් සිදුකළ විමර්ශන පාණිනීන්ගේ ශාස්ත්‍ර සේවාවට බෙහෙවින් උපස්ථම්භක වන්නට ඇති බවත් පාණිනීන්ගේ අෂ්ටාධ්‍යායීයේ විශිෂ්ටත්වය හා පූර්ණත්වය නිසා ම ඒ පූර්ව කෘති අභාවයට යන්නට ඇති බවත් මැක්ඩොනල් කියයි.[15] එහෙත් අග්‍රවාල් කියන පරිදි ක්‍රි.ව. 7වන සියවසේ දී පාණිනීන්ගේ ජන්ම ග්‍රාමය නැරඹූ යූ ආං ච්වාංගේ සටහන් අනුවත් පතඤ්ජලීගේ විස්තර අනුවත් අෂ්ටාධ්‍යායීයේ විශිෂ්ටත්වය හා පූර්ණත්වය පාණිනීන්ගේ ම උත්සාහයේ ප්‍රතිඵලයක් බව දතහැකි වේ. එමෙන් ම වෛයාකරණඥයන්ගේ ව්‍යායාමයේ අග්‍රඵලය වශයෙන් දක්නට ඇති ආදි ම කෘතිය එය වන හෙයින් ද විද්‍යමාන සාධක අනුව පාණිනී ම වෛදික භාෂාව හා සංස්කෘත භාෂාව අතර සම්බන්ධය

---

12 ජිනසෝම වීරසූරිය, පිටු 44-48

13 ඉන්ද්‍රශ්චාන්ද්‍රාඃ කාශකෘත්ස්පිශලඃ ශාකටායනඃ
පාණිනය්‍යමර ජෛනේන්ද්‍රාඃ ජයන්ත්‍යාෂ්ටෞ හි ශාබ්දිකාඃ

14 පාණිනීය ශික්ෂා, විද්‍යාලංකාර විශ්වවිද්‍යාල ශාස්ත්‍රීය සංග්‍රහය, 1972

15 A. A. Macdonell, A Sanskrit Grammar for Students, Oxford University Press, 1955, Introduction, p.X

දක්වන පුරුක වශයෙන් සැලකීම යෝග්‍ය ය.[16] අෂ්ටධ්‍යායි ව්‍යාකරණය බෙහෙවින් ම ශබ්දානුශාසනයකි. මෙහි මූලික ප්‍රතිපත්තිය නම් ක්‍රියාවන්ගෙන් සියළු නාමයන් නිපදවා ගන්නා ලද බව යි. ධාතුව, උපසර්ගය, ප්‍රත්‍යය යනුවෙන් වචනයක් විග්‍රහ කොට ලිවිය හැකි ඉතාම සරල මූලයන්ගෙන් පටන් ගන්නා පාණිනී ධාතුන්ගෙන් නාම මූලයන් හා ක්‍රියා මූලයන් ද තැනෙන අයුරුත් මූලයන්ගෙන් සම්පූර්ණ වචන තනාගන්නා අයුරුත් දක්වයි. පාණිනීගේ ශබ්දසාධනයෙහි විශේෂ ලක්‍ෂණයක් නම් ප්‍රත්‍යයන් මගින් පමණක් ශබ්ද නිෂ්පත්තිය සිදුවෙතැයි ඔහු පිළිගැනීම යි.

පාණිනීගේ ව්‍යාකරණයෙහි අධ්‍යාය හෙවත් පරිච්ඡේද අටකි. ඊට අෂ්ටාධ්‍යායී යන නාමය ලැබී ඇත්තේ ද එහෙයිනි.

1. අධ්‍යාය - සංඥා - පාරිභාෂික ශබ්ද හා ඒවායේ අර්ථ නිරූපණ
2. අධ්‍යාය - නාම විභක්ති - නාම තැනීම හා විභක්තීන් යෙදීම
3. අධ්‍යාය - ධාතු ප්‍රත්‍ය - ධාතුවලට ප්‍රත්‍යයන් එකතුවීම
4. අධ්‍යාය - නාම ප්‍රත්‍ය - නාම මූලයන්ට ප්‍රත්‍ය එකතු කිරීම
5. අධ්‍යාය - නාම ප්‍රත්‍ය - නාම මූලයන්ට ප්‍රත්‍ය එකතු කිරීම
6. අධ්‍යාය - පද සාධන - පද සාධානයේ දී සිදුවන උච්චාරණ විභ්නයේ හා ශබ්ද ලක්‍ෂණයේ වෙනස්කම්
7. අධ්‍යාය - පද සාධන - පද සාධානයේ දී සිදුවන උච්චාරණ විභ්නයේ හා ශබ්ද ලක්‍ෂණයේ වෙනස්කම්
8. අධ්‍යාය - වාක්‍ය නිර්මාණ - වාක්‍යයක පද යෙදීම කළයුතු ආකාරය

පැරණි ව්‍යාකරණකරුවන්ට වඩා වෙනස් මගක් ගත් පාණිනී එවකට පැවති වාග්රීති සකස් කොට තම කෘතියට ඇතුළත් කළ අතර තමාට ම සීමා වූ නව වාග් රීති රැසක් ද එයට එකතු කිරීමෙන් සංස්කෘත ව්‍යාකරණය අංග සම්පූර්ණ බවට පත් කළේය.

[16] V.S. Agraval, India as Known to panini, Lucknow, 1935, pp. 2,3,12,13